# 21 ඉල්ලන්නාට දෙනු ලැබේ

අන්තෝනි බාස් : අනේ ෆාදර්, මාස තුන හතරක ඉඳලා මට හරි වැඩක් පලක් ලැබුණේ නැහැ. කොහොම ජීවත් වෙන්ඩ ද කියලා මට තේරෙන්නේ නැහැ.

පියතුමා : ඔබ භක්තිමත් කතෝලිකයෙක්. දිනපතා දෙවියන් වහන්සේට යාච්ඤා කරන පුද්ගලයෙක්. ඔබ දෙවියන් වහන්සේ කෙරෙහි ලොකු විශ්වාසයක් තියෙන කෙනෙක්. බලාපොරොත්තු නැති කර නොගෙන දෙවි පියාණන් වහන්සේගෙන් ඔබේ අවශ්‍යතාව ඉල්ලා සිටින්න. උන්වහන්සේ ඔබේ ඉල්ලීම ඉටු කරාවි. මමත් කරන්න පුළුවන් උදව්වක් කරන්නම්.

(ගෙදර පැමිණි අන්තෝනි බාස්)

ආනා මරියා : මොකද ලොකු ෆාදර් කියන්නේ?

අන්තෝනි බාස් : ෆාදර් කියනවා, විශ්වාසය අඩු කර ගන්නේ නැති ව දිගට ම දෙවි පියාණන් වහන්සේට යාච්ඤා කරන්න ලු.

ආනා මරියා : ඒක නෙමේ, මට බයිබල් සමාගමේ දේවගැතිවරයෙක් කියනවා, කතෝලික පල්ලියෙන් අයින් වෙලා ඒ ගොල්ලන්ගේ ආගමට එනවා නම් ලක්ෂයක් දෙන්නම් ලු .... ඉතින් මං කිව්වා "අප සේවය කරන්නේ එක ම දෙවියන් වහන්සේට පමණයි. මං බඩගින්නේ මැරුණත් ආගම වෙනස් කරන්නේ නැහැ" කියලා

අන්තෝනි බාස් : ආගම විකුණගෙන කන උන් එක්ක ගිහිල්ලා, අපට අපාගත වෙන්න උවමනාවක් නැහැ. අපි දෙවි පියාණන් වහන්සේ ගැන විශ්වාසය තබා ගනිමු. අපි දිගට ම යාච්ඤා කරමු. අපට වරදින එකක් නැහැ.

(දිනක් අන්තෝනි බාස් සොයා ගෙන ප්‍රදේශයේ උපකාරක පන්ති පවත්වන සුමනසිරි මහතා පැමිණියේ ය.)

සුමනසිරි : මට ඉක්මනට ඩෙස්ක් පන්සියයකුයි පුටු පන්සියයකුයි හදා ගන්න ඕනෑ. මොරටු මුල්ලේ ඉන්න හොඳ ම වඩු කාර්මිකයා ඔබ බව මම දන්නවා. ඔබට පුළුවන් ද මගේ අවශ්‍යතාව ඉටු කරන්න?

අන්තෝනි බාස් : අපොයි මොනවා කතා කරනවා ද? මං ඔබට ඒ වැඩේ වගකීමෙන් ඉක්මනට කරලා දෙන්නම්.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

සුමනසිරි : හොඳයි, ඔබ මේ වැඩේ හොඳට කරලා දුන්නොත් මං ලක්ෂ පහක් දෙන්නම්. දැන් අත්තිකාරම් විදිහට ලක්ෂ දෙකක් දෙන්නම්, වැඩේ කෙරෙන හැටියට ඉතිරි සල්ලිත් දෙන්නම්. මොකද කියන්නේ?

අන්තෝනි බාස් : මං කරලා දෙන්නම් මහත්තයෝ.

(සුමනසිරි මහතා ඒ වෙලේ ම රුපියල් ලක්ෂ දෙකක් අන්තෝනි බාස්ට දුන්නේ ය. එදා ම හවස අන්තෝනි බාස් පියතුමා සොයාගෙන ගොස් මුදලක් පියතුමාගේ අතේ තැබුවේ ය.

අන්තෝනි බාස් : මේ මුදල පල්ලියේ වැඩකට ගන්න. මට ලක්ෂ පහක වැඩක් අද ලැබුණා. දෙවි පියාණන් අත් නොහැර විශ්වාසවන්ත ව යාච්ඤා කරපු නිසා මට දරුවන්ගේ අවශ්‍යතා ඉටු කිරීමට වැඩක් ලැබුණා. දෙවි පියාණන්ට ස්තෝත්‍ර වේවා!

## එලියා දිවැසිවරයාගේ යාච්ඤාව

කාර්මේල් කන්ද මත එලියා දිවැසිවරයා පූජාසනයක් ඉදි කළේ ය. එලියා දිවැසිවරයා හා බාල් දෙවියන්ගේ දිවැසිවරු යාග දෙකක් සූදානම් කළහ. සැබෑ දෙවියන් වහන්සේ ගින්නක් එවා යාගය දැවීමෙන් යාගය බාර ගන්නා බවට පිළිගැනිණි. බාල් දෙවියන්ගේ දිවැසිවරු යාච්ඤා කළත් ඔවුන්ගේ යාගය ගින්නෙන් නොදැවිණි. එලියා දිවැසිවරයා යාගයට ජලය වත් කොට දෙවියන් වහන්සේට මෙසේ යාච්ඤා කළේ ය;

"ආබ්‍රහම්ගේ ද ඊසාක්ගේ ද ඉශ්රායෙල්ගේ ද දෙවි සමිඳාණන් වහන්ස, ඔබ ඉශ්රායෙල්හි දෙවියන් වහන්සේ බව ද මා ඔබේ සේවකයා බව ද මා මේ දෙය කෙළේ, ඔබේ වචනය ලෙස බව ද අද ඔවුන්ට දැනගන්නට ලැබේවා! සමිඳාණන් වහන්ස මට උත්තර දුන මැනව. ස්වාමීන් වන ඔබ දෙවියන් වහන්සේ බවත්, මේ සෙනඟගේ සිත් නැවත හරවා ගත්තේ ඔබ ම බවත් මොවුන් දැනගන්න පිණිස මට උත්තර දුන මැනව"යි කී ය.

එවිට සමිඳාණන් වහන්සේ වෙතින් ගිනි බැස පූජාවත්, දරත්, ගලුත්, ධූලිත් දවා අගලේ වතුරත් වියළවා දැමී ය.

(1 රාජාවලිය 18:36-38)

මෙම සිදුවීමෙන් සැබෑ දෙවියන් කවුරුන්දැයි ඔප්පු විණි.

කාර්මේල් කන්ද මත කළ දවන පූජාව අවසාන වීමත් සමග ම නියඟය නිම වී වර්ෂාව ඇති විය. දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තබන අය උන්වහන්සේ ආරක්ෂා කරන සේක. තව ද ඔවුන්ගේ අවශ්‍යතාවල දී සහාය වන සේක. එබැවින් අප ද එදිනෙදා ජීවිතය

තුළ පැනනගින නොයෙකුත් අසහනකාරී තත්ත්වයන් හමුවේ ස්ථිර ඇදහිල්ලෙන් යුතු ව දෙවියන් වහන්සේට යාච්ඤා කළ යුතු වේ.

## ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමා යාච්ඤාව තුළින් වර්ෂාව ලබා දීම



21.1 රූපය - ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමා මහනුවර දී යාච්ඤා කිරීම

දෙවන විමලධර්මසූරිය රජ සමයේ දී ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමා මහනුවර සිරකරුවෙකු ව සිටියේ ය. එකල පැවති දීර්ඝ නියඟය නිසා මහනුවර හා අවට වැසියෝ මහත්සේ පීඩා වින්දෝ ය. වගා සියල්ල පාළු වූවා පමණක් නොව බීමට පවා ජලය නොමැති විය. මේ සඳහා බෞද්ධ හා අනෙකුත් ආගමික වතාවත් නොකඩා සිදු කළ ද වර්ෂාවක ලකුණක්වත් පහළ නොවී ය. අවසානයේ දී රජතුමා මේ සඳහා ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමාගෙන් සහාය ඉල්ලී ය. ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමා රජවාසල ඉදිරිපිට වූ චතුරස්‍රයෙහි අල්තාරයක් සාදා ඒ මත කුරුසියක් තබා ඉමහත් භක්තියෙන් යුතු ව යාච්ඤා කළේ ය. වැඩි වේලාවක් නොගොස් අහස කළු කර මහා වර්ෂාවක් ඇද හැලෙන්නට පටන් ගත් අතර, ඒ වර්ෂාවෙන් එක් ජල බිඳක්වත් ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමා හා අල්තාරය මත පතිත නොවී ය.

විශ්වාසයෙන් යුතු ව කෙරෙන අයැදීම තුළ ප්‍රාතිහාර්ය සිදු වේ. එබැවින් අප ද විශ්වාසයෙන් යුතු ව දිනපතා යාච්ඤා කිරීමට යොමු විය යුතු ය. යාච්ඤාව තුළින් අප ලබන අත්දැකීම් මත අන් අය ද විශ්වාසයෙන් යුතු ව යාච්ඤා කිරීමට යොමු කිරීම අපගේ යුතුකමකි.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම

1. එලියා දිවැසිවරයා කාර්මෙල් කන්ද මත කළ යාච්ඤාවෙන් ඔබේ ජීවිතයට ලැබෙන මග පෙන්වීම් **දෙකක්** ලියන්න.
2. විශ්වාසයෙන් යුතු ව අයැදීම තුළ ඔබගේ අවශ්‍යතාවක් ඉටු වූ අවස්ථාවක් කෙටියෙන් විස්තර කරන්න.
3. විශ්වාසය හීන මිතුරෙකුට ඔහුගේ ඇදහිල්ල වර්ධනය කර ගැනීමට ඔබ ලබා දෙන උපදෙස් කෙටියන් විස්තර කරන්න.

**ජීවිතයට බිඳක්**

*විශ්වාසයෙන් යුතු ව අවැසිතා දෙවියන් වහන්සේගෙන් ඉල්ලන්න.*



නොමිලේ බෙදාහැරීම සඳහා ය.